සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

80 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I, II
தகவல் தொடர்பாடல் தொழினுட்பவியல் I, II
Information & Communication Technology I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** $01011_2$ යන ද්විමය සංඛ්‍යාවට තුල්‍ය දශමය සංඛ්‍යාව කුමක් ද?
(1) 11 (2) 35 (3) 15 (4) 10

**2.** $111110110010_2$ යන ද්විමය සංඛ්‍යාවට තුල්‍ය අෂ්ටක සංඛ්‍යාව කුමක් ද?
(1) $7552_8$ (2) $2667_8$ (3) $2557_8$ (4) $7662_8$


**3.** $11101011000111010_2$ ට තුල්‍ය ෂඩ්දශමය සංඛ්‍යාව වන්නේ,
(1) $DD63A_{16}$ (2) $1D63A_{16}$ (3) $1D33A_{16}$ (4) $1D631_{16}$

**4.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න:
A - $2B_{16}$ යන්න $53_8$ ට තුල්‍ය වේ
B - $43_{10}$ යන්න $101011_2$ ට තුල්‍ය වේ
C - $101011_2$ යන්න $53_8$ ට තුල්‍ය වේ
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B, C සියල්ල ම ය.

**5.** පහත සඳහන් කුමන සන්නිවේදන මාධ්‍යය ආලෝකය පරාවර්තනය කිරීම මගින් දත්ත සම්ප්‍රේෂණය සිදු කරයි ද?
(1) නොවැසුණු ඇඹරු කම්බි යුගල (UTP) (2) ප්‍රකාශ තන්තු (Optical fiber)
(3) සමාක්ෂ කේබල (Coaxial cables) (4) වැසුණු ඇඹරු කම්බි යුගල (STP)

**6.** සමහර උපක්‍රම (devices) ආදාන (input) හෝ ප්‍රතිදාන (output) ලෙස පමණක් ක්‍රියා කරන අතර, තවත් සමහරක් ආදාන සහ ප්‍රතිදාන යන දෙයාකාරයටම ක්‍රියා කරයි. පහත සඳහන් ඒවා අතුරෙන් කවරක් ප්‍රතිදාන උපක්‍රම ලෙස පමණක් ක්‍රියා කරයි ද?
(1) ස්පර්ශක තිරය (touch screen display) සහ සුපිරික්සකය (scanner)
(2) මුද්‍රණ යන්ත්‍රය සහ වෙබ් කැමරාව
(3) මුද්‍රණ යන්ත්‍රය සහ ස්පීකරය (speaker)
(4) ස්පර්ශක තිරය (touch screen display) සහ තීරු කේත කියවනය (barcode reader)

**7.** දකුණු පසින් දැක්වෙන තර්කන පරිපථයට (logic circuit) තුල්‍ය සත්‍යතා වගුව කුමක් ද?




(1)

| A | B | ප්‍රතිදානය |
|---|---|---|
| 0 | 0 | 1 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

(2)

| A | B | ප්‍රතිදානය |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 0 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |

(3)

| A | B | ප්‍රතිදානය |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 0 |
| 1 | 1 | 0 |


(4)


| A | B | ප්‍රතිදානය |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 0 |


ICTnotes.org


[දෙවැනි පිටුව බලන්න.


**8.** දකුණු පසින් දැක්වෙන තර්කන පරිපථයේ සත්‍යතා වගුව හා තුල්‍ය සත්‍යතා වගුවක් සහිත තර්කන පරිපථය කුමක් ද?




(1)



(2)



(3)



(4)



**9.** පහත සඳහන් වගන්ති සලකා බලන්න:

A - දෘඩාංග කළමනාකරණය
B - පරිශීලක අතුරු මුහුණත (user interface) ලබා දීම
C - පැතුරුම්පත් හා වදන් සැකසුම් පහසුකම් ලබා දීම

ඉහත සඳහන් ඒවායින් මෙහෙයුම් පද්ධතියක (operating system) මූලික කාර්ය වන්නේ

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

**10.** පහත සඳහන් වගන්ති සලකා බලන්න:

A - පරිගණකයක රෙජිස්තර මතක (register memory) ධාරිතාව දෘඪ තැටියක ධාරිතාවට වඩා කුඩා වේ.
B - රෙජිස්තර මතකයේ දත්ත ප්‍රවේශ වේගය (access speed) දෘඪ තැටියේ එම වේගයට වඩා අඩු වේ.
C - රෙජිස්තර මතකයේ දත්ත ආචයනය (store) සඳහා බිටුවකට යන වියදම, දෘඪ තැටියේ දත්ත ආචයනය සඳහා බිටුවකට යන වියදමට වඩා වැඩි වේ.

ඉහත වගන්ති අතුරෙන් සත්‍ය වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

**11.** පහත සඳහන් වගන්ති සලකන්න

A - සොරකම් කරන ලද වෙනත් අයෙකුගේ පරිශීලක නාමය (user ID) සහ මුරපදයක් (password) භාවිත කර පරිගණකයකට ප්‍රවේශ වීම
B - බලපත්‍ර සඳහා මුදල් ගෙවීමක් නොකර නිදහස් හා විවෘත මූල මෘදුකාංග (free and open source software) බාගැනීම (downloading) හා ස්ථාපනය (installing) කිරීම
C - මාර්ගගත (online) සාප්පුවක කළමනාකරු විසින් පාරිභෝගිකයින්ගේ කැමැත්ත නොමැතිව ඔවුනගේ විද්‍යුත් තැපැල් ලිපින ලැයිස්තුවක් අලෙවිකරණ සමාගමකට විකිණීම

ඉහත සඳහන් කවර නිදසුන් මගින් සදාචාර විරෝධී (ethical issues) ක්‍රියාකාරකම් සිදු වේ ද?

(1) A සහ B මගින් පමණි (2) B සහ C මගින් පමණි (3) A සහ C මගින් පමණි (4) A, B හා C සියල්ල ම මගිනි

**12.** පහත Ⓟ, Ⓠ, Ⓡ හා Ⓢ ලෙස ලේබල් කර ඇති නිරූපක හතර, ලේඛනයක ඇති පාඨ (text) එකෙල්ල (align) කිරීම සඳහා වදන් සැකසුම් මෘදුකාංගවල සාමාන්‍ය වශයෙන් භාවිත කරනු ලැබේ.



Ⓟ Ⓠ Ⓡ Ⓢ

පහත දක්වා ඇති වගන්ති සලකා බලන්න:

A - Ⓟ මගින් පාඨ වමට එකෙල්ල කරන අතර, Ⓡ මගින් පාඨ දකුණට එකෙල්ල කරනු ලබයි.
B - Ⓟ මගින් පාඨ වමට එකෙල්ල කරන අතර, Ⓢ මගින් පාඨ දකුණට පමණක් එකෙල්ල කරනු ලබයි.
C - Ⓠ මගින් පාඨ මැදට එකෙල්ල කරන අතර, Ⓢ මගින් පාඨ වමට හා දකුණට යන දෙපසටම එකෙල්ල (justify) කරනු ලබයි.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

**13.** දකුණත් භාවිතකරුවකු විසින් ගොනු බහලුමක් (folder) තුළ තිබෙන පැතුරුම්පත් ගොනුවකට සිදු කරන ලද පහත සඳහන් කාර්ය සලකා බලන්න:

A - මූසික දර්ශකය (mouse pointer) ගොනුව මත ස්ථානගත කර මූසිකයේ දකුණු බොත්තම එක් වරක් ක්ලික් කිරීම
B - මූසික දර්ශකය ගොනුව මත ස්ථානගත කර මූසිකයේ දකුණු බොත්තම දෙවරක් ක්ලික් කිරීම
C - මූසික දර්ශකය ගොනුව මත ස්ථානගත කර මූසිකයේ වම් බොත්තම දෙවරක් ක්ලික් කිරීම

ඉහත සඳහන් ඒවායින් පැතුරුම්පත් ගොනුව විවෘත වීම සිදු වන්නේ

(1) A මගින් පමණි. (2) B මගින් පමණි. (3) C මගින් පමණි. (4) A හා C මගින් පමණි.

ICTnotes.org

[තුන්වැනි පිටුව බලන්න.

**14.** වදන් සැකසුම් මෘදුකාංගවල සාමාන්‍යයෙන් භාවිත වන කෙටි මං යතුරු සම්බන්ධව පහත දක්වා ඇති වගන්ති සලකා බලන්න:

A - Ctrl + C යන්න පාඨ/වස්තු කොපි කිරීම (copy) සඳහා භාවිත කරයි.
B - Ctrl + A යන්න ලේඛනයක ඇති සියලු පාඨ/වස්තු තේරීම (select) සඳහා භාවිත කරයි.
C - Ctrl + V යන්න කොපි කරන ලද පාඨ/වස්තු ඇලවීම (paste) සඳහා භාවිත කරයි.

ඉහත කුමන වගන්ති නිවැරදි වේ ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

**15.** පැතුරුම්පතක කෝෂයකට =2^3+(5-3)*6/4 සූත්‍රය ඇතුළත් කර තිබේ. එම කෝෂයෙහි පෙන්නුම් කරනු ලබන සංඛ්‍යාව කුමක් ද?

(1) 5 (2) 8.5 (3) 11 (4) -1.25

- අංක **16** සහ **17** ප්‍රශ්න සඳහා දී ඇති පැතුරුම්පත් කොටස සහ පහත දක්වා ඇති තොරතුරු පාදක කරන්න.

* අරය $r$ ලෙස දී ඇති විට වෘත්තයක පරිධිය ගණනය කිරීම සඳහා $2\pi r$ සූත්‍රය භාවිත කරනු ලැබේ.
* C2 කෝෂයේ දක්වා ඇත්තේ $\pi$ හි අගය බව උපකල්පන කරන්න.

| | A | B | C |
|---|---|---|---|
| 1 | අරය | පරිධිය | π |
| 2 | 20 | 125.6637061 | 3.14159 |
| 3 | 21 | 131.9468915 | |
| 4 | 25 | 157.0796327 | |
| 5 | 22 | 138.2300768 | |
| 6 | | | |

**16.** වෘත්තයේ පරිධිය ගණනය කිරීම සඳහා B2 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය කුමක් ද?

(1) =2*$C$2*A2 (2) =2*$C2^$A2 (3) =2*C2^A2 (4) =2^C2^A2

**17.** A6 කෝෂයට = SUM(A2:A5)/COUNT(A2:A5) සූත්‍රය ඇතුළත් කළ විට පහත සඳහන් කවරක් A6 කෝෂයේ දිස්වන්නේ ද?

(1) 1 (2) 17.6 (3) 22 (4) 88

**18.** **සමර්පන (presentation) මෘදුකාංගයක් භාවිතයෙන් නිපදවන ලද, විවිධ වස්තූන් (objects) ඇතුළත් කදාවක් (slide) සම්බන්ධයෙන් පහත වැකි සලකා බලන්න:**

A - කදාවක ඇති විවිධ වස්තූන්ට *සජීවන ආවරණ* (*animation effects*) යෙදිය හැකි ය.
B - *කදා සංක්‍රාන්තිය* (*slide transition*) යොදා ගත හැකි වන්නේ මුළු කදාවටම පමණි.
C - *කදා දැක්ම දසුනේ* (*slide show view*) දී කදාවක සිට ඊළඟ කදාවට මාරු වීමේ දී *කදා සංක්‍රාන්ති ආවරණය* ඇති වේ.

ඉහත කවර වගන්ති නිවැරදි වන්නේ ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

- අංක **19** සිට **22** තෙක් ප්‍රශ්න සඳහා පහත දී ඇති ශිෂ්‍යයන්ගේ විෂය ලකුණු ආචයන සඳහා භාවිත කර ඇති දත්ත සමුදා වගු පාදක කර ගන්න.

**ශිෂ්‍ය වගුව**

| DoB | Name | Student_No | Class |
|---|---|---|---|
| 20/11/95 | Sarath | 1001 | 1A |
| 17/12/95 | Kolitha | 1002 | 1A |
| 21/10/95 | Kapila | 1003 | 1A |
| 18/12/95 | Nalin | 1004 | 1B |

**විෂය වගුව**

| Sub_Code | Subject |
|---|---|
| 01 | Sinhala |
| 02 | Art |
| 03 | English |

**ලකුණු වගුව**

| Sub_Code | Student_No | Marks |
|---|---|---|
| 01 | 1001 | 85 |
| 02 | 1001 | 80 |
| 01 | 1002 | 65 |
| 03 | 1003 | 70 |

**19.** විෂය වගුවෙහි ක්ෂේත්‍ර (fields) සංඛ්‍යාව කොපමණ ද?

(1) 2 (2) 3 (3) 4 (4) 6

**20.** ශිෂ්‍ය වගුව සඳහා ප්‍රාථමික යතුර (primary key) ලෙස වඩාත්ම යෝග්‍ය ක්ෂේත්‍රය කුමක් ද?

(1) Student_No (2) DoB (3) Name (4) Class

**21.** දත්ත සමුදායෙහි ආගන්තුක යතුර (foreign key) සඳහා නිදසුනක් වන්නේ කවරක් ද?

(1) විෂය වගුවෙහි Sub_Code (2) ලකුණු වගුවෙහි Sub_Code
(3) ලකුණු වගුවෙහි Marks (4) ශිෂ්‍ය වගුවෙහි DoB

**22.** ඉංග්‍රීසි (English) සඳහා කපිල (Kapila) ලබාගත් ලකුණු සංඛ්‍යාව කොපමණ ද?

(1) 65 (2) 70 (3) 80 (4) 85

ICTnotes.org

**23.** දත්ත සමුදාය මෘදුකාංගයක් සම්බන්ධයෙන් පහත වගන්ති සලකා බලන්න:

A - එක් වස්තුවකට (object) සම්බන්ධිත ක්ෂේත්‍ර එකතුවකට උපලැකියානක් (record) යැයි කියනු ලැබේ.


B - සම්බන්ධිත වගු (related tables) එකතුවකට දත්ත සමුදායක් යැයි කියනු ලැබේ.

C - එක් වගුවක ආගන්තුක (foreign) යතුර තවත් වගුවක ප්‍රාථමික (primary) යතුර වේ.

ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ කවරක් ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

**24.** ගැලීම් සටහනක් භාවිතයෙන් විස්තර කර ඇති පහත දැක්වෙන ඇල්ගොරිතමය සලකන්න:




ගැලීම් සටහනෙහි ආදාන (inputs) ලෙස X=10 හා Y=20 ලබා දුන්නේ නම්, අනුපිළිවෙළින් X හා Y සඳහා දර්ශනය කරනු (display) ලබන අගයන් මොනවා ද?

(1) 10, 10 (2) 10, 20 (3) 20, 10 (4) 20, 20

**25.** 1 සිට 10 තෙක් වූ සංඛ්‍යාවල (numbers) ගුණිතය (product) ලබා ගැනීම සඳහා Ⓟ ලේබලය ඇතුළත් පහත ව්‍යාජ කේතය (pseudocode) සලකන්න:

```
product = 1
number = 0
repeat
      number = number + 1
      product = product * number
until Ⓟ
```

Ⓟ ලේබලය සඳහා නිවැරදි ප්‍රකාශනය කුමක් ද?

(1) *number* > 10 (2) *number* < 10 (3) *number* >= 10 (4) *number* <= 10


**26.** පෙන්වා ඇති ගැලීම් සටහනෙහි ඇති ඇල්ගොරිතමයේ තර්කනය හා තුල්‍ය වන්නේ කුමන ව්‍යාජ කේත කොටස ද?

(1)
```
N=1
while N<=10
   N=N+1
   display N
end while
```

(2)
```
for N=0 to 10 do
   display N
```

(3)
```
N=0
while N<=10
   display N
   N=N+1
end while
```

(4)
```
for N=1 to 10 do
   display N
```




ICTnotes.org

**27** පහත සඳහන් ව්‍යාජ කේතය සලකන්න:

```
X = 0
do
   display '*'
   X = X + 2
while X < 5
```

ඉහත ව්‍යාජ කේතයේ ප්‍රතිදානය ලෙස '*' කොපමණ වාර සංඛ්‍යාවක් දර්ශනය වේ ද?

(1) 2 (2) 4 (3) 5 (4) 6

**28.** පහත සඳහන් ව්‍යාජ කේතය සලකන්න:

```
if average>70 then
    if Sport_colour = 'True' then
        Allrounder_award = 'True'
    end if
end if
```

ඉහත දක්වා ඇති ව්‍යාජ කේතයේ තර්කයට පහත සඳහන් කවරක් තුල්‍ය වේ ද?

(1) average>70 AND Sport_colour = 'True' නම්, එවිට Allrounder_award = 'True' වේ.
(2) average>70 OR Sport_colour = 'True' නම්, එවිට Allrounder_award = 'True' වේ.
(3) average>70 නම්, එවිට Allrounder_award = 'True' වේ.
(4) Sport_colour = 'True' නම්, එවිට Allrounder_award = 'True' වේ.

- අංක **29** සහ **30** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ඡේදය භාවිත කරන්න.

පාසල් පුස්තකාලයෙන් පොත් වෙන් කර ගැනීම (reserve) එහි පරිශීලකයින් විසින් දැනට කරගෙන යනු ලබන්නේ පෝරමයක් සම්පූර්ණ කිරීම මගිනි. පොත ලබා දිය හැකි වූ විට පුස්තකාලය මගින් පරිශීලකයාට ලිපියක් යැවීමෙන් ඒ බව දන්වා සිටිනු ලැබේ. සමහර අවස්ථාවල දී අත්වැරදීමෙන් වැරදි පරිශීලකයකු වෙත මෙවැනි දන්වා යැවීම් සිදු වේ. පුස්තකාලයාධිපති විසින් වත්මන් අත්යුරු පද්ධතිය වෙනුවට නව තොරතුරු පද්ධතියකින් ප්‍රතිස්ථාපනය කිරීමට සැලසුම් කර ඇත. නව පද්ධතියේ දී පරිශීලකයකුට මාර්ගගතව (online) පොතක් වෙන්කර ගත හැකි වේ. වෙන් කරන ලද පොත ලබා දිය හැකි වූ විට, නව පද්ධතිය, ඒ බැව් විද්‍යුත් ලිපියක් මගින් පරිශීලකයා වෙත දන්වනු ලැබේ. පුස්තකාලයාධිපති විසින් අත්යුරු පද්ධතිය හා නව පද්ධතිය යන පද්ධති දෙකම ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත්තේ නව පද්ධතිය ගැටළුවක් නොමැතිව ක්‍රියාත්මක වන බැව් තහවුරු කර ගන්නා තෙක් ය.

**29.** පුස්තකාලයාධිපතිගේ යෝජනාව හා සම්බන්ධ පහත වගන්ති සලකා බලන්න:

A - නව පද්ධතිය මගින් පොත් වෙන් කර ගැනීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනය කරයි.
B - නව පද්ධතිය මගින් පොත් වෙන් කර ගැනීමේ ක්‍රියාවලියේ නිරවද්‍යතාව දියුණු කරයි.
C - නව පද්ධතිය මගින් අන්තර්ජාලයට පිවිසිය නොහැකි පරිශීලකයන් වෙත අහිතකර බලපෑමක් ඇති කරයි.

ඉහත වගන්ති අතුරෙන් වලංගු වන්නේ කවරක් ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

**30.** ඉහත තොරතුරු පද්ධතිය සඳහා යෝජිත ක්‍රියාත්මක කිරීමේ (deployment) ආකාරය කුමක් ද?

(1) සමාන්තර (parallel) (2) කලාගත (phased)
(3) ඍජු (direct) (4) සමාන්තර හා ඍජු යන දෙක ම

**31.** "http://www.doenets.lk/exam/" යන URL එක සලකා බලන්න. මෙහි "doenets.lk" යනු,

(1) වසම් නාමය (domain name) වේ.
(2) අධි පාඨ තැන්මාරු නියමාවලිය (Hypertext Transfer Protocol) වේ.
(3) අදාළ සම්පත් ද්‍රව්‍ය ඇති ස්ථානයේ පථය වේ.
(4) සම්පත් ද්‍රව්‍ය (resource) වේ.


**32.** අදාළ URL එක නොදන්නා විට, වෙබ් අඩවියක ඇති තොරතුරක් සොයා ගැනීමට පහත සඳහන් කුමක් භාවිත කළ හැකි ද?

(1) සෙවුම් යන්ත්‍රය (search engine) (2) ගොනු තැන්මාරු නියමාවලිය (FTP)
(3) විද්‍යුත් තැපැල් සේවාදායකය (email server) (4) වසම් නාම සේවාදායකය (domain name server)

ICTnotes.org

[හයවැනි පිටුව බලන්න.

**33.** අජිත් සහ තවත් තිදෙනකුට යවන ලද විද්‍යුත් තැපැල් ලිපියක පහත පෙන්වා ඇති කොටස සලකා බලන්න:




ඉහත පෙන්වා ඇති පරිදි විද්‍යුත් තැපැල් ලිපියක් ඔබ ajith@doe.lk වෙත යැවූයේ නම්, මෙම ලිපිය ලැබී ඇතැයි අජිත්ට දැකගත හැකි වන අයවලුන් වන්නේ කවුරුන් ද?

(1) ajith@doe.lk පමණි
(2) ajith@doe.lk, rizvi@nie.lk සහ kumar@school.net පමණි
(3) ajith@doe.lk, rizvi@nie.lk, kumar@school.net සහ frank@nie.lk පමණි
(4) ajith@doe.lk සහ frank@nie.lk පමණි

**34.** මඳ වේගී අන්තර්ජාල සම්බන්ධතාවයක් හේතුවෙන් පරිශීලකයකුට රූපයක් (image) දැක ගත නොහැකි වන අවස්ථාවක දී ආදේශක තොරතුරක් ලබා දිය හැකි වන්නේ HTML හි ඇති පහත සඳහන් කුමක් භාවිතයෙන් ද?

(1) src (2) href (3) alt (4) img

**35.** http://www.moe.gov.lk වෙත 'Ministry of Education' අධිසන්ධානය (hyperlink) තනාගැනීම සඳහා නිවැරදි HTML කේතය කුමක් ද?

(1) <a>http:// www.moe.gov.lk</a>
(2) <a href="http:// www.moe.gov.lk"> Ministry of Education</a>
(3) <a name="http:// www.moe.gov.lk"> Ministry of Education </a>
(4) <a url="http:// www.moe.gov.lk"> Ministry of Education </a>

**36.** HTML භාවිතයෙන් අංකිත ලැයිස්තුවක් (numbered list) ලබා ගැනීම සඳහා පහත කවර HTML උසුලනය (tag) භාවිත කළ හැකි ද?

(1) <ul> (2) <dl> (3) <ol> (4) <list>

**37.** පහත සිද්ධි සලකා බලන්න:

A - උප්පැන්න සහතිකයක මුල් පිටපතෙහි පිටපතක් මාර්ගගතව (online) ලබා ගැනීම
B - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වෙබ් අඩවිය හරහා ජල බිල්පත් මාර්ගගතව ගෙවීම
C - වාහනයක් සඳහා ආදායම් බලපත්‍රය මාර්ගගතව ලබාගත ගැනීම

ඉහත සඳහන් කවරක් e-රාජ්‍ය සේවා හා සම්බන්ධ වන්නේ ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

**38.** පහත වගන්ති සලකා බලන්න:

A - නිර්බාධක ජව සැපයුම (UPS)
B - මෘදුකාංග ගිනිපවුර (software firewall)
C - පරිගණකයකට ප්‍රවේශ වීම (login) සඳහා පරිශීලක නාම (user name) හා මුරපද (password) භාවිතය

ඉහත සඳහන් කවරක් තාර්කික ආරක්ෂාව සඳහා නිදසුන් වේ ද?

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ල ම

**39.** පහත සඳහන් කවරක් අන්තර්ජාල භාවිතයේ නිරුපද්‍රිත භාවිත සඳහා උදාහරණ වන්නේ ද?

A - දුරකථන අංක හා ලිපිනය වැනි පෞද්ගලික තොරතුරු සමාජ ජාලවල දී සඟවා තැබීම
B - නොදන්නා පුද්ගලයින්ගෙන් ලැබෙන විද්‍යුත් තැපැල් ලිපිවල ඇති සන්ධාන (links) මත ක්ලික් කිරීම
C - සමාජ ජාලවලදී නාඳුනන අය සමග සන්නිවේදනය කිරීම

(1) A පමණි (2) B පමණි (3) C පමණි (4) A හා C පමණි

**40.** පහත සඳහන් වගන්ති සලකන්න:

A - e-අපද්‍රව්‍ය (electronic waste) අපරීක්ෂාකාරී අයුරින් පරිසරයට බැහැර කිරීම
B - භාවිතයට ගත නොහැකි සංයුක්ත ප්‍රතිදීප්ත පහන් (CFL) සහ අනෙකුත් ඉලෙක්ට්‍රොනික උපකරණ (devices) ප්‍රතිචක්‍රීය මධ්‍යස්ථාන වෙත බාර දීම
C - භාවිත කළ හැකි මට්ටමේ පවතින ඉලෙක්ට්‍රොනික උපකරණ ඉවත නොදමා වෙනත් අයට විකිණීම හෝ පරිත්‍යාග කිරීම

ඉහත සඳහන් දෑ අතුරෙන් ආරක්ෂිත e-අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා නිදසුන් වන්නේ

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) B හා C පමණි. (4) A, B හා C සියල්ල ම ය.

ICTnotes.org

* *

[හත්වැනි පිටුව බලන්න.

# ICT විෂයට අදාළ සියලුම ඉගෙනුම් උපකාරක එකම තැනකින්

ICTnotes.org + VLE

| | | |
|---|---|---|
| පාඩම්වල වලට අදාළ සටහන් | පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර | පෙරහුරු හා වාර විභාග ප්‍රශ්න පත්‍ර |

## CLICK HERE TO DOWNLOAD

